# දැන්වීමයි

## උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### පොළොන්නරුව මහ නගර සභාවේ හා පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ
### ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ
### පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම - 2018

පොලොන්නරුව මහ නගර සභාවේ හා පොලොන්නරුව ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයට අයත් පහත සඳහන් තනතුරු වල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් උතුරු මැද පළාතේ පොලොන්නරුව දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචි ස්ත්‍රී/ පුරුෂ දෙපාර්ශවයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2018/07/04 වේ. මෙම තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ජූලි මස අගදී පොලොන්නරුව නගරයේදී පැවැත්වීමට නියමිතය.

➢ **ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණය - පුරප්පාඩු තනතුරු**

- ❖ කාර්යාල කාර්ය සහායක
- ❖ වැඩ/ ක්ෂේත්‍ර කම්කරු
- ❖ සෞඛ්‍ය කම්කරු
- ❖ සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත් පදනම)

**පැවරෙන කාර්යයන් -:**

**කාර්යාල කාර්ය සහායක** - පළාත් පාලන ආයතන කාර්යාලයන්හි කාර්යාලය හා කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම, කාර්යාලීය උපකරණ හා යන්ත්‍ර ක්‍රියාකාරීත්වය, නඩත්තුව, ලිපි ලේඛන එහා මෙහා ගෙන යාම, ගබඩා කටයුතු ඇතුළත්ව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් අදාළ රාජකාරී කටයුතු.

**වැඩ/ක්ෂේත්‍ර කම්කරු** - පළාත් පාලන ආයතනයන්ට අයත් මාර්ග නඩත්තුව, අලුත්වැඩියාව හා ඊට අදාළ සියලු ක්ෂේත්‍ර කාර්යයන් හා එම ආයතන ප්‍රධානියා පවරනු ලබන වෙනත් අදාළ රාජකාරී.

**සෞඛ්‍ය කම්කරු** - පළාත් පාලන ආයතනයන්ට පැවරී ඇති සියලු සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් නඩත්තුව ඇතුළු පවිත්‍රතා කටයුතු හා සියලු එයට අදාළ කාර්යයන් සහ ආයතන ප්‍රධානියා විසින් පවරනු අදාළ ලබන වෙනත් සියලු රාජකාරී.

**සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්)** - පළාත් පාලන ආයතනයන්හි කසළ ප්‍රතිචක්‍රියකරණයට අදාළ එක්රැස්කිරීම්, ප්‍රවාහන කටයුතු ඇතුළුව ඒ හා සම්බන්ධව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් අදාළ සියලු රාජකාරී.

- යම් තනතුරකට බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

02. **සුදුසුකම් -:**

**02.1 පොදු සුදුසුකම්** -: සියලු සුදුසුකම් 2018/07/04 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත අයකු විය යුතුය.

III. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

IV. රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලද නිලධාරීන් ඉහත තනතුරු සඳහා අයදුම් කරන්නේනම් ඔවුන්, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහක කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය. එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු අතර, සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

V. අයදුම්කරු අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් උතුරු මැද පළාතේ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

**02.2 අධ්‍යාපන සුදුසුකම්**

| අනු අංකය | සේවා ගණය | තනතුරු | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| 01. | ප්‍රාථමික – ශිල්පීය නොවන සේවා ගණය | කාර්යාල කාර්ය සහායක | 8 ශ්‍රේණිය(9 වසර) සමත්ව තිබීම. |
| | | වැඩ/ ක්ෂේත්‍ර කම්කරු | |
| | | සෞඛ්‍ය කම්කරු | |
| | | සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත් පදනම) | |

03. **වැටුප් ක්‍රමය -:**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 ට අනුව වැටුප් කේත අංක PL 01 - 2016 යටතේ වැටුප් පරිමාණය රු. 24,250 - 10×250 - 10×270 - 10×300 - 12×330 - 36,410/- වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ. මීට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව හා වෙනත් අදාළ දීමනා ද මාසිකව ගෙවනු ලැබේ.

04. **සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි -:**

(අ) මෙම තනතුරු ස්ථිරය. නමුත් ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයට අයත් සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත් පදනම) මත බඳවාගන්නා සේවකයින් වාර්ෂික කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලබන අතර, ඉදිරි කොන්ත්‍රාත් කාලය සේවා අවශ්‍යතාවය අනුව තීරණය කෙරේ.

(ආ) ස්ථිර තනතුරු සඳහා පත්වන සේවකයින් හට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව තීරණය කරනු ලැබේ.

(ආ) මෙම ස්ථිර තනතුරු සඳහා පත්වන සේවකයින් වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නියමයන් හා රෙගුලාසි වලටද යටත් විය යුතුය.

(ඈ) තෝරාගනු ලබන අයදුම්කරුවන් එම අවස්ථාව වන විට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර නොසිටියේ නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයක් මත අදාළ තනතුරට පත් කරනු ඇත. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු නම් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්වනු ඇත.

(ඉ) මෙම තනතුරු වලට බඳවා ගනු ලබන අයගේ සේවා කොන්දේසි අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට යටත්ව තීරණය වේ.

(ඊ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

05. **අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම -:**

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී 21×29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය. අංක 01 සිට 04 තෙක් වූ ශීර්ෂ පළමු වන පිටුවෙහිද, ඉතිරිය ඊළඟ පිටුවටද ඇතුළත් වන පරිදි සකස් කර ඊට අදාළ තොරතුරු නිවැරදිව හා පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

(ආ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018/07/04 දින හෝ ඊට පෙර **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, අනුරාධපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"පළාත් පාලන ආයතන වල ප්‍රාථමික සේවා ගණයේ (ඉල්ලුම් කරන තනතුර සඳහන් කරන්න) තනතුර සඳහා බඳවා ගැනීම - 2018"** යන්න සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඇ) තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(ඉ) රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(ඊ) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් හා සම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර නොමැති අයදුම්පත් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වනු නොලැබේ. තැපැලේ දී අස්ථාන ගතවීම හෝ ප්‍රමාද වීම පිළිබඳව වූ කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(උ) දැනටමත් රාජ්‍ය සේවයේ තනතුරක නොමැති අයදුම්කරුවන් තම අයදුම්පතේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

06. **බඳවා ගැනීම -:**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත,අයදුම්කරුවන් ලබන ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදීම සිදු කෙරේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| | ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 |
| II. | ක්‍රීඩා කුසලතා | 15 |
| III. | ප්‍රජා දයකත්වය හා සමාජ සුබ සාධන කටයුතු | 15 |
| IV. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාව | 10 |
| | **මුළු ලකුණු** | **50** |

07. **පොදු කරුණු -:**

I මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය අනුව යම් අපේක්ෂකයකු/ අපේක්ෂිකාවක ඉදිරිපත් කර ඇති තොරතුරු සාවද්‍ය බව අනාවරණය වුවහොත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අතරතුර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ තෝරා පත්කර ගැනීමෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය/තෝරා ගැනීම/පත්වීම අවලංගු කරනු ලැබේ.

II එසේම තෝරාගත්/පත්වීම් ලද අයකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව තහවුරු වුවහොත් හෝ හිතාමතා යම් අදාළ තොරතුරු යටපත් කර ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර පත්වීම් ලබා ඇති බව හෝ රජයේ සේවය අතහැර ගිය අයකු හෝ අසාධු ලේඛනගත වීමෙන් රජයේ තනතුරක් ලැබීමට නුසුදුස්සකු වී ඇති බවට අනාවරණය වීමත් සමඟ ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහකිරීමට යටත් වේ.

III සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික වල මුල් පිටපත් (සහතික කළ ඡායා පිටපත් සමගින්) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ දිනයේදීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. **සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට නොහැකි වන කිසිදු ලේඛනයක් පසුව භාර ගනු නොලැබේ.**

IV කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ලබන අයෙකුට රජයේ ස්ථිර තනතුරකට පත්වීමක් සඳහා කිසිදු අයිතිවාසිකමක් නොලැබේ.

08. අනුකූලතාවය -: සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

මෙම දැන්වීමෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතිය ද, කිසියම් පුරප්පාඩු වලින් කොටසක් හෝ මුළුමනින්ම හෝ පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේ ය.

**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**උතුරු මැද පළාත.**
**2018.06.04**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

# පොළොන්නරුව මහ නගර සභාවේ හා පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම - 2018

**ඉල්ලුම් කරන තනතුර :** ..........

01. a. අයදුම්කරුගේ මුල් කුරු සමග නම : ..........

..........

b. සම්පූර්ණ නම :- (සිංහලෙන් / දෙමළෙන්) : ..........

..........

02. i. ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) : ..........

..........

ii. ලිපි එවිය යුතු ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) : ..........

..........

iii. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ..........

iv. දිස්ත්‍රික්කය තුළ පදිංචි කාලය : ..........

v. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........

vi. ග්‍රාම නිලධාරී වසම හා අංකය : ..........

vii. දුරකථන අංකය : ස්ථාවර : .......... ජංගම : ..........

03. i. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

ii. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

iii. ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ : ☐ (අදාල කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න)

iv. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු ☐☐ මාස : ☐☐ දින ☐☐

04. ශ්‍රී ලාංකික පුරවැසියෙකු ද යන වග : ඔව් ☐ නැත ☐ (අදාල කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න)

**05. අධ්‍යාපන සුදුසුකම් :**

(i) සමත් වසර (ශ්‍රේණිය) : .......... වර්ෂය : ..........

(ii) අ.පො.ස. (සා.පෙළ) විභාගය (ඇත්නම් පමණි) :

විභාග අංකය : .......... වර්ෂය : ..........

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 06 | | |
| 02 | | | 07 | | |
| 03 | | | 08 | | |
| 04 | | | 09 | | |
| 05 | | | 10 | | |

(iii) වෙනත් සුදුසුකම් : ..........

..........

06. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද ? ඔව් ☐ නැත ☐

(අදාල කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න)

ඔව් නම් විස්තර සපයන්න : ..........

07. **අයදුම්කරුගේ සහතිකය :**

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෝ සොයාගනු ලැබුවහොත් එසේ සොයාගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් මෙම අයදුම්පත අවලංගු වන බවද, තෝරාගැනීමෙන් පසුව නම් යම් කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහ කරනු ලබන බවද, පිළිගනිමි.

**දිනය :** ..........

..........

**අයදුම්කරුගේ අත්සන.**

08. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......... මයා / මිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු / ඇය .......... දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

..........

දිනය. (සහතික කරන්නාගේ අත්සන)

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ..........

තනතුර : ..........

ලිපිනය : ..........

(නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුයි.) ..........

09. දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවය කරන නිලධාරීන් සඳහා පමණක් අදාල වේ.

**දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති .......... මයා / මිය / මෙය .......... දෙපාර්තමේන්තුවේ / ආයතනයේ .......... දින සිට .......... දින දක්වා .......... වශයෙන් සේවය කරන අතර, ඔහුට / ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා චාර්තා වී ඇත. / නැත. ඔහුගේ / ඇයගේ වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක / අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු / ඇය .......... තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන් / ආයතනයෙන් මුදා හැරීමට හැකි / නොහැකිබව දන්වනු කැමැත්තෙමි.

..........

**දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන**

**(නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුයි.)**